# බෞද්ධ දර්ශනික පිළිබිඹුව හා නූතන සිංහල සංයුක්ත කවිය

අපරැක්කේ සිරිසුධම්ම හිමි[1]

## හැඳින්වීම

සිංහල පද්‍ය සම්ප්‍රදාය ගී විරිතෙන් ද, පසුව සංදේශ කාව්‍ය තුළින් සිව්පදයට ද, ඉන්පසු දසපද, දොළොස්පද, බැහැලි, උපහැලි, අඹහැලි, චිත්‍ර බන්ධන, දුෂ්කර බන්ධන, සිලෝ විරිත්, දෙපද, නිසදැස් ආදි ආකෘති භාවිතය තුළ විකාසනය වී තිබේ. ඒ ආකාරයෙන් විකාසනය වන ලාංකේය පද්‍ය සංස්කෘතිය පැනෙන යම් විප්ලවීය ධාරණාවක් මතු කළ නූතනවාදී පද්‍ය ප්‍රවණතාවක් ලෙස සංයුක්ත කවිය දැක්විය හැකිය. වර්තමානයේ මේ සම්බන්ධයෙන් විවිධ මතවාද, ප්‍රතිරෝධතා උද්ගත වී ඇත. සංයුක්ත කවිය තුළ දක්නට ලැබෙන්නේ චිත්‍රමය ස්වරූපයකි. සිව්පද, ගී විරිත්, දෙපද, තුළ පෝෂණය වූ ලාංකේය පද්‍ය සාහිත්‍යයට සංයුක්ත කවිය නවමු අද්දැකීමකි. මන්ද යත්, සංයුක්ත කවිය යනු සම්මත කවියටත් චිත්‍ර කලාවටත් අතර මැදි ස්වරූපයක් උසුලන බැවිනි. සංයුක්ත කවියෙහි ලෝක ව්‍යාපාරය දියත් කරන ලද්දේ බොලීවියාවේ උපත ලද ස්වීස් කිවි ඉයුජින් ගොම්රින්ජර් (Eugen Gomringer) විසිනි. 1953දී ඔහු විසින් ජර්මන් බසින් සංයුක්ත කවි තිස් තුනක් පළ කරන ලදි. සංයුක්ත කවි එකතුවක පළමු අද්දැකීම මෙයයි. සංයුක්ත කවියේ ලෝක ව්‍යාපාරයෙහි ප්‍රතිඵලයක් වශයෙන් එම කාව්‍ය ප්‍රවණතාව ලංකාව තුළද ප්‍රචලිත වෙමින් පවතී. 1963දී මහගම සේකරයන් විසින් සංරචිත 'හෙට ඉරක් පායයි' කෘතියෙහි සංයුක්ත ලක්ෂණ මුලින් දැකගැනීමට හැකිවිය. එහෙත් සංයුක්ත කවිය ලාංකේය පද්‍යයෙහි නිර්මාණය කරනු ලබන්නේ අජිත් තිලකසේනයන්ගේ ආගමනයෙනි. ඔහුගේ 'මල් වැනි ගල්' පද්‍ය කෘතියෙහි සමුපේත සංයුක්ත කවි මඟින් ලාංකේය ජනයා සංයුක්ත කවිය නැමැති නව්‍ය පද්‍ය ප්‍රවණතාව පිළිබඳ දැනුවත් වෙයි. එහිදී ලෝක ව්‍යාපාරයෙහි පතළ 'Concrete poetry' යන නාමය සිංහල පද්‍යය තුළ සංයුක්ත කවිය ලෙස භාවිත වන්නට පටන් ගනී. සංස්කෘත සං පූර්ව √යුජ් හා පාලි සං පූර්ව යුජ ධාතුවෙන් නිපන් 'සංයුක්ත' යන්න 'යෝජේති' (යෙදීම) යන ක්‍රියා පදයෙන් සැදී ඇත. එහිදී 'යෝජේති' යන්නෙහි අතීත කෘදන්ත පදය 'යුක්ත'(යුජ්+ත) යන්නයි. ඒ අනුව සං+යුජ්+ත ප්‍රත්‍යයයෙන් මෙම වචනය නිෂ්පන්නව ඇත. සංයුක්ත යන පදය ශ්‍රී සුමංගල ශබ්දකෝශයේ අර්ථ ගන්වා ඇත්තේ 'එකට යෙදීම' යන අරුතෙන් ය. එසේම 'එක්ව ගළපනවා,' 'මිශ්‍ර කරනවා', යන අරුත පාලි ඉංග්‍රීසි ශබ්දකෝෂයේ දක්වා ඇත. සංයුක්ත යන්නෙහි 'එකට ගැළපීම, එක්ව යෙදීම, මිශ්‍ර කිරීම, මනාව යෙදීම,

---

1 සහාය කථිකාචාර්ය, සිංහල අධ්‍යයන අංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
sudhaaparekke@gmail.com

මුහු කිරීම, කළවං කිරීම, සංකලනය කිරීම, බැඳුණු, සම්බන්ධ, යා කළ, සබැඳි' යන අරුත් ඇත.

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙම පර්යේෂණය සාධනය කිරීමෙහිලා පුස්තකාලය මඟින් දත්ත රැස් කරනු ලැබේ. එහිදී අජිත් තිලකසේන ආදි නූතන සංයුක්ත පද්‍ය රචකයන්ගේ නිර්මාණ මේ සඳහා යොදා ගැනේ.

**දත්ත විශ්ලේෂණය**

ඉහත අර්ථයන්ගෙන් සමන්විත සංයුක්ත කවිය; නූතන සිංහල කවියෙහි නව්‍යතම පද්‍ය ප්‍රවණතාවකි. එය භාෂාවේ දෘශ්‍ය සඥ්ඥාව හා සමායෝජිතය. එම පද්‍ය ප්‍රවණතාව සූක්ෂ්‍යම විමර්ශනයේදී එහි බෞද්ධ දර්ශනික සංකල්පද සංගෘහිත බව පසක් වේ. එවැනි සංයුක්ත කවි පාඨක මනස තුළ බෞද්ධ දර්ශනික සංකල්ප පිළිබඳ සිතා බැලීමට ඉඩ හසර ලබා දෙයි. බුදුදහම පිළිබඳ දැනුමක් ඇත්තන්ට එවැනි සංයුක්ත කවි නිවැරදිව කියවිය හැකිය. එහෙයින් මෙහිදී නූතන සිංහල සංයුක්ත කවිය තුළ දිස්වන බෞද්ධ දර්ශනික එළඹුම් සාකච්ඡාවට භාජනය වන අතර එමඟින් බුදුදහමේ ගැඹුරු සත්තාවන් සම්බන්ධයෙන් මිනිසා දැනුවත් වීම තුළ ඇති වන උපයෝගිතාව පිළිබඳ අවධානය යොමු කරයි. ඒ සඳහා නූතන සංයුක්ත කවීන්ගේ නිර්මාණ භාවිත කරයි. කවිය වැනි සියුම් භාවිතයන් මඟින් මිනිසාව දැනුවත් කිරීම අතීතයේ සිටම පැවත එන්නකි. එහෙයින් එවැනි කවි මඟින් බුදුදහමේ දර්ශනික සංකල්ප සාකච්ඡා කිරීම ඉතා සියුම්ව බුදුදහමේ ප්‍රගමනයට දයකත්වයක් සැපයීමකි.

භාෂාව ශ්‍රව්‍ය, දෘශ්‍ය වශයෙන් සංඥ ද්වයකින් සමන්විතය. සංයුක්ත කවිය එහිදී දෘශ්‍ය සංඥ ගණයට වැටේ. සංයුක්ත කවි තුළ දක්නට ලැබෙන්නේ දෘශ්‍යමය ස්වරූපයකි. කවි කියවනවා වෙනුවට කවි බලා රස විඳීම සංයුක්ත කවියක ඇති විශේෂත්වයයි. සංයුක්ත කවියෙහි දෘශ්‍යමය උපරිමය වචන හා අකුරුවල උපරිමයයි. එනිසා සංයුක්ත කවිය තුලද දෘශ්‍යමය සීමාව භාෂාව නමැති සංඥවයි. මෙහිදී භාෂාව සංඥවක් සේ සලකා සංයුක්ත කවි කියවිය යුතුය. එවැනි සංයුක්ත කවි කිහිපයක ඇති බෞද්ධ දර්ශනික ඇගයුම කවි කිහිපයක් මූලාශ්‍රයෙහි තබා විස්තර කළ හැකිය.




අජිත් තිලකසේන විසින් 'රචිත රැලි' සුළි කාව්‍ය සංග්‍රහයෙහි දක්වෙන සංයුක්ත කවියක් ඉහත දැක්වේ. 'වෙසක්' යන වචනය ඇසූ සැණින් සාමාන්‍ය මිනිසාට සිහිවනුයේ බුදුරජාණන් වහන්සේගේ තෙමඟුල නොව දන්සල්, තොරණ, කැරකෙන කූඩුවලින් සජ්ජිත කාලවකවානුවකි. ඉහත සංයුක්ත කවිය තුළ දක්නට ලැබෙන්නේ යම් කැටයම ස්වභාවයක් ය. ඒ අනුව මිනිසා සරලව සැමරිය යුතු බුදු තෙමඟුල වර්තමානයේ වාණිජකරණයට ලක්ව ඇති අයුරු ඉහත සංයුක්ත කවියෙන් ප්‍රකට වන්නනේයැයි අනුමාන කළ හැකි ය.




මිනිසා සැමවිට තමාට ආත්මාර්ථය සලසන දැඩි දෘෂ්ටීන්හි එල්බ ගෙන සිටියි. එම දෘෂ්ටීන්ගෙන් සංලක්ෂිත උපැස් යුවලක් සැම දෙනාම පැළඳගෙන සිටිති. ඒ වැරදි දෘෂ්ටිකෝණ තුළ සිරව සිටින තුරු කිසිවෙකුට නිවැරදි යථාර්ථය අවබෝධ කරගත නොහැකිය. එය බුදුදහමේ ද උගන්වන කාරණයකි. මිනිසා දෂ්ටිගතව වෙසෙනතාක් මේ සසරෙහි සැමද දුක්විඳිය යුතු බව බෞද්ධ ඉගැන්වීම්වල සඳහන් වේ.



පුද්ගලයා ගත කරන ජීවිතය තුළ විඳින සැම සිද්ධියකට ම ප්‍රධාන රෝග කාරකය සංසාරය යි. මෙම සංසාරයෙහි ජීවත්වන පුරාවට, සත්‍ය අවබෝධ කරගන්නා තුරු ඉන් මිදිය නොහැකිය. එම සංසාරය මෙතෙකැ යි, මෙපමණැ යි ගණනය කළ නොහැකිය. එහි මාර්ගය අතීතයට සහ අනාගතයට අනන්තය. මෙවැනි අනුභූතීන් වචනයෙන් විස්තර කළ නොහැකිය. ඒ බව සංයුක්ත නිකායෙහි **අනමතග්ග සූත්‍රයෙහි** ද විස්තර කර ඇත. එම බෞද්ධ දර්ශනික චින්තාව සංයුක්ත කවියා තම නිර්මානකරණයට යොදගන්නේ එලෙසිනි.

| | | |
|---|---|---|
| ලෝරන්ස්ගේ දෘෂ්ටිය | ලිංගිකත්වය විමුක්තිය | |
| | ලිංගිකත්වය | විමුක්තිය |
| | ගිකත්වය | මුක්තිය |
| | කත්වය | ක්තිය |
| | වය | තිය |
| | ය | ය |
| බුදුරදුන්ගේ දෘෂ්ටිය | ය | විමුක්තිය |
| | ත්වය | මුක්තිය |
| | කත්වය | ක්තිය |
| | ගිකත්වය | තිය |
| | ලිංගිකත්වය | ය |

මෙහි ඇත්තේ ඉතා ගැඹුරු බෞද්ධ සංකල්පනාවකි. එය සංයුක්ත කවිය තුළ චරිත දෙකක ඇසුරෙන් චිත්‍රණය කර ඇත. එහි අර්ථය සොයා යෑමට මේ චරිත දෙකෙහිම දේශනාවන් හා ප්‍රකාශයන් සම්බන්ධයෙන් දැනීමක් තිබිය යුතුය. එනිසා ඒ තුළ ඇත්තේ පරම අර්ථකථනයක් සැපයීමට ඇති අපහසුවයි. කෙසේ වෙතත් ඩී. එච්. ලෝරන්ස් පවසන්නේ විමුක්ති සාධනය සඳහා ලිංගිකත්වය බැහැර කළ යුත්තක් නොව එය සාධනය කළ යුත්තක් බවයි. එහෙත් බුද්ධ දේශනාව ඊට හාත්පසින් වෙනස්ය. බුදුරාජණන් වහන්සේ දේශනා කරනුයේ ලිංගිකත්වය සසර ගමනෙහි කෙලෙස් වැඩීමකට මිස කෙලෙස් තැවීමකට හේතු නොවන බවයි. මෙහිදී ලෝරන්ස්ගේ දෘෂ්ටිය අනුව විමුක්තියට ලිංගිකත්වය ඔස්සේ ආශ්‍රව ටිකෙන් ටික ගොඩගැසීමත් බුදුරදුන්ගේ ඉගැන්වීම අනුව ලිංගිකත්වය දුරලීමෙන් විමුක්තියට ආශ්‍රව ටිකෙන් ටික ක්ෂය කිරීමත් යන කාරණා කවියෙහි භාෂාමය හැඩතල අනුව පැහැදිලි වේ. එහෙයින් සිංහල පද්‍ය ප්‍රවණතාවෙහි නව්‍යතම පද්‍ය ප්‍රවණතාව වන සංයුක්ත කවිය තුළ දක්නට ලැබෙන දෘශ්‍යමය ආමන්ත්‍රණයන් බෞද්ධ දර්ශනික සංකල්පයන් ද විග්‍රහ කිරීමට නූතන කවීන් යොදගැනීම ප්‍රශංසනීයය. එමෙන්ම ඒ තුළ බුදුදහම සම්බන්ධයෙන් පාඨකයාට නවමු අද්දැකීමක් ලැබෙනු ඇත.

**සමාලෝචනය**

සංයුක්ත කවිය වැනි නවමු පද්‍ය ප්‍රවණතා පාඨකයාව බුදුදහම පිළිබඳ ගැඹුරු අවධානයකට කැන්දන අතර එමඟින් සිදුවන පෙළඹවීම ඉතා සියුම්ව

කවිය මගින් බුදුදහමේ ප්‍රචාරණයට හේත්වාධාර වේ. එය සාහිත්‍යය හා රසාස්වාදය ඔස්සේ සියුම්ව සිදුවන්නකි.

**ප්‍රමුඛ පද**: සංයුක්ත කවිය, බෞද්ධ දර්ශනය, දෘශ්‍යමය සංඥා, නූතන කවිය

**ආශ්‍රිත ග්‍රන්ථ**

තිලක්සේන අජිත්.(2010). *රැලි සුළ*. නුගේගොඩ: සරසවි ප්‍රකාශකයෝ.
තිලක්සේන අජිත්. (2003). *ගල්වැනි මල්*. මුල්ලේරියාව: විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය.
තිලකසේන, අජිත්. (2008). *මාරියාව*. ඇස්. කොළඹ: ගොඩගේ සහ සහෝදරයෝ.
සිරිසුධම්ම හිමි, අපරැක්කේ. (2011). *මතු සම්බන්ධයි*. බත්තරමුල්ල: සමීර ප්‍රකාශන.